www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අගමැති පුවත්පත වෙනුවෙන් පෙනී සිටි නීතිඥයන් "ද්‍රෝහීන්" ලෙස හෙළා දකියි

## Sri Lankan prime minister denounces newspaper lawyers as "traitors"

**2009 ජුලි 25**

**අපේ වාර්තාකරු විසිනි**

ජුලි 21 වන දින පාර්ලිමේන්තුවේ දී අසාමාන්‍ය වූ ප්‍රකාශයක් කරමින් අගමැති රත්නසිරි වික්‍රමනායක, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් පවරා තිබූ අපහාස නඩුවක විත්ති පක්ෂය වූ සන්ඩේ ලීඩර් පුවත්පත වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින් පස් දෙනා "ද්‍රෝහීන්" ලෙස හංවඩු ගැසීය. එසේම වික්‍රමනායක ඒ හා සමාන ආකාරයකින් නීතිඥයින්ට පහර දෙමින්, ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවියේ පල කොට තිබුනු ලිපියකට ද සිය අනුමැතිය පල කලේය.

විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂයට (එජාප) හිතැති සන්ඩේ ලීඩර් පත්‍රයට එරෙහි නඩුවට දිගු වාර්තාවක් තිබේ. 2007 දෙසැම්බරයේ දී ද ගෝඨාභය රාජපක්ෂ එම පුවත්පතෙහි පලවූ ලිපි දෙකකට එරෙහිව රුපියල් කෝටි සීයක් (එජ ඩොලර් මිලියන 9 ක්) වන්දි ඉල්ලා පුවත්පත අධිකරනය හමුවට පැමිනවීය. සන්ඩේ ලීඩර්හි පලකොට තිබුනේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සම්බන්ධ ගුවන් යානා ගනුදෙනුවකින් රාජපක්ෂ අයුතු ප්‍රයෝජන ලැබූ බවයි.

අපහාසාත්මක ලිපි පලකිරීම පිලිබඳව අධිකරනය, පුවත්පතට එරෙහිව නිරෝධාඥාවක් පැනවිය යුතුයයි කියා සිටිමින් පසුගිය දෙසැම්බරයේ දී රාජපක්ෂ පීඩනය ඉහල නැංවීය. අධිකරනය තහනම් නියෝගයක් පැනවූ අතර සන්ඩේ ලීඩර් එවැනි දේ පලකිරීමෙන් වැලකී සිටින බවට එකඟ විය. ජූනි මාසයේ දී රජපක්ෂ හා ඔහුගේ ආධාරකරුවෝ, එකක් ඔහු ගැනත් අනෙක එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් ගැනත් පලවූ ලිපි දෙකක් අල්ලා ගත්හ. එමගින් ඔහු ප්‍රභාකරන්ට සමාන කොට ඇති බවත් යලිත් මඩගැසීමක යෙදෙන බවත් කියා සිටියේය. අධිකරනයට අපහාස කිරීම සම්බන්ධයෙන් දඬුවම් නොකිරීමට හේතු දක්වන ලෙස විනිශ්චයකාර වරයා පුවත්පතට නියෝග කලේය.

බලපෑම් මත බව පැහැදිලිව ම පෙනෙන්නට තිබුන ද, ජූනි 23 වනදා සුනිල් ලංකාතිලක හා රෙෂාන් ගමගේ යන සන්ඩේ ලීඩර් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු දෙදෙන, තහනම් නියෝගය කඩ කල බවට පුවත්පතට එල්ල වී ඇති චෝදනාව හේතු කොට ගෙන තමන් නඩුවෙන් ඉවත් වන බව ප්‍රකාශ කලහ. ආරක්ෂක අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය ජයග්‍රාහී ලෙස ප්‍රකාශ කලේ, "රට වෙනුවෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ කැපවීම නිසා, ඔහුට විරුද්ධව පෙනී සිටීමට ඔවුන්ට නොහැකිවී ඇතැයි කියා සිටිමින් ඔවුන් ඉවත්වී තිබෙන බවයි."

ජුලි 10 වන දින, සන්ඩේ ලීඩර් හා එහි නව නීතිඥවරු පස්දනාට එරෙහි පීඩනය උත්සන්න කිරීමේ අරමුන සහිතව, ආරක්ෂක අමාත්‍යාංශය අලුත් ලිපියක් පල කලේය. "කලු කබා හැඳි ද්‍රෝහීන් එකට කල්ලි ගැසෙති" යන සිරස් තලය සහිත ලිපියෙන්, "අතීතයේ දී එල්ටීටීඊ සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටීමේ හා ඔවුන් ආරක්ෂා කිරීමේ ඉතිහාසයක් අලුත් කන්ඩායමට ඇතැයි" ප්‍රකාශ කරමින් ශ්‍රීනාත් පෙරේරා. උපුල් ජයසූරිය, එස්. සුමන්තිරන්, විරාන් කොරයා හා අතුල රනගල යන නීතිඥවරුන්ට පහර දුන්නේය.

නම් නොකරමින් "ජ්‍යෙෂ්ඨ නීතිඥවරු" ලෙස හඳුන්වා දී තිබුනු පුවත්පතේ නීතිඥ කන්ඩායම, "යූඑන්පී ගැති කටයුතු තුලින් ලද දේශද්‍රෝහී ආවේශයක්" පෙන්නුම් කරන බව ලිපියෙන් කියා සිටියි. ලිපියේ කර්තෘ "පස්දෙනාගේ හැසිරීම සමස්ත වෘත්තියටම නිගාවක් හා ශ්‍රී ලංකාව වසර 30 කට පසුව ලත් සැබෑ නිදහස භුක්ති විඳින මේ අවස්ථාවේ දී කිසි සේත්ම පිලිගත නොහැකි" යයි කියා ඇත. නීතිඥයින් පස්දෙනා ජාති ද්‍රෝහීන් ලෙස හංවඩු ගසමින් ඔහු ලිපිය අවසන් කරයි.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය (බීඒඑස්එල්) මෙම ලිපිය හෙළා දකිමින් එය වෙබ් අඩවියෙන් ඉවත් කල යුතු බව කියා සිටියේය. නීතිමය ආරක්ෂාව පිලිබඳ මූලික අයිතිය අවධාරනය කරමින් "නීතිඥවරු සිය සේවා දායකයන් වෙනුවෙන් පෙනී සිටීම වැලැක්වීමට හෝ සේවා දායකයන්ට නීතිඥවරුන්ගේ සේවය ලබාගැනීමේ හා පුද්ගලයන් නීතිඥවරුන්ගේ සේවය ලබාගැනීමේ හෝ නීතිඥවරු සේවාදායකයන් වෙනුවෙන් පෙනී සිටීම වැලැක්වීමට දරන කුමන උත්සාහයන් හා සියලු උත්සාහයන් නීතිඥ සංගමය හෙළා දකියි." යනුවෙන් එහි මාධ්‍ය නිවේදනය සඳහන් කලේය.

ජාත්‍යන්තර නීතිඥ සංගමයේ මානව අයිතින් පිලිබඳ ආයතනය ද ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් වරයාට ලියමින්, එම ලිපියත් සමග, එල්ටීටීඊ සැකකරුවන් වෙනුවෙන් පෙනීසිටි නීතිඥවරුන්ට පහර ගසමින් "මානව අයිතීන් උල්ලංඝනය කරන්නෝ කවුරුන් ද?" යන හිසින් යුක්තව ඊට පෙර පලකොට තිබූ ලිපියත් ඉවත් කරගන්නා ලෙස ඉල්ලා සිටියේ ය. මෙම ලිපි මගින් "නම්කල නීතිඥවරුන්ගේ කායික ආරක්ෂාව බරපතල ලෙස අනතුරේ හෙලිය හැකි" බවට එම ආයතනය අනතුරු ඇඟවීය.

එයට පිලිතුරු වශයෙන් ජූලි 21 වන දින ආරක්ෂක ලේකම්, "ද්‍රෝහීන්" ගේ ලිපිය ඉවත්කර ගැනීම ප්‍රතික්ෂේප කල අතර නීතිඥවරුන්ට එරෙහි ඔහුගේ ප්‍රහාරය ද නොනැවැත්වීය. එදින ම පාර්ලිමේන්තුවේ දී විරුද්ධ පක්ෂයේ විවේචන වලට පිලිතුරු වශයෙන් අගමැති වික්‍රමනායක, "ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රජාව හා ලෝකය මත්, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සැබෑ දේශප්‍රේමියෙක් බව පිලිගත යුතු" යයි කියා සිටියේය.

ආරක්ෂක අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය ආරක්ෂාකල වික්‍රමනායක, *සන්ඬේ ලීඩර්* වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු, එය විසින් නිවැරදි ලෙසම ද්‍රෝහීන් ලෙස හෙලා දැක තිබෙන්නේ යයි කියා සිටියේය. "රටේ ව්‍යවස්ථාව හා ශ්‍රේෂ්ඨාධිකරනයේ නියෝග උල්ලංඝනය කරන කුමන හෝ පුද්ගලයන් ඔවුන් නියැලී සිටින වෘත්තිය නොසලකා ජාතික අභිවෘද්ධියට ද්‍රෝහීන් වන්නේය. එබැවින් කුමන නීතිඥවරයෙක්, වෛද්‍යවරයෙක් හෝ සාමාන්‍ය පුරවැසියෙක් වුව ද රටේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නේ නම් ඔහු හෝ ඇය ද්‍රෝහියෙකු ලෙස හඳුන්වා දිය හැක" ඔහු කියා සිටියේය.

සිය සේවාදායකයින් ආරක්ෂා කිරීම මගින් නීතිඥවරු, රටේ ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇත්තේ කෙසේ දැයි පෙන්වා දීමට වික්‍රමනායක අසමත් විය. යථාර්තය නම්, එන්ට එන්ටම රටේ ව්‍යවස්ථාවට හා නීතියට පිටින් කටයුතු කරමින් සිටින්නේ ආන්ඩුව ම වීමයි. නිදසුනක් ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ, 17 වන ආන්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුකූලව ව්‍යවස්ථාදායක කොමිසමක් පිහිටුවන ලෙසට අන කරමින් ශ්‍රේෂ්ඨාධිකරනය ඔහුට කල නියෝගය නොතකා හැර තිබේ. කොමිසමෙන්, රාජ්‍ය නිලධාරීන්ගේ පත්වීම් අධීක්ෂනය කිරීමට ව්‍යවස්ථාව මගින් නිර්දේශිත අනෙකුත් සංස්ථාවන් පත්කිරීමේ ඉඩකඩ සැලසෙන අතර මෙම තනතුරු වලට සිය සමීප හෙන්චයියන් පත්කර ගැනීමට ජනාධිපතිට සැලසෙන ඉඩ ප්‍රස්ථාවන්ට එය හරස් වනු ඇත.

*සන්ඬේ ලීඩර්* හා එහි නීතිඥවරුන්ට එරෙහි ප්‍රහාර වනාහි, මාධ්‍ය හා දේශපාලන විරුද්ධවාදීන් බියගැන්වීමෙහි ලා ආන්ඩුව ගෙන යන පුලුල් ව්‍යාපාරයක කොටසකි. ජනාධිපති රාජපක්ෂ හා ඔහුගේ ඇමතිවරු, මිලිටරිය විසින් ගෙන ගිය යුද අපරාධ හෝ පාලන තන්ත්‍රයේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීම්, සීමිත ආකාරයකට පවා පෙන්වා දෙන ඕනෑම අයෙකුට නිර්දය ලෙස පහර දෙනු ලැබේ. එල්ටීටීඊ පරාජයෙන් පසුව ආන්ඩුව, ලක්ෂ තුනක් පමන දෙමල සිවිල් වැසියන් රැඳවුම් කඳවුරු තුල සිරකොට ඇත.

ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවිය "ද්‍රෝහීන්" ලෙසට කරන චෝදනාව හුදෙක් නම් පටබැඳීමක් නොව නිශ්චිත තර්ජනයකි. පසුගිය තෙවසරක කාලය තුල ආරක්ෂක හමුදාවන්ගේ අනුදැනුම ඇතිව ක්‍රියා කරන ආන්ඩුවට ගැති ඝාතක කල්ලි විසින් සිය ගනන් ජනතාව මරාදමා හෝ නිකම්ම "අතුරුදහන්" කර ඇත. *සන්ඬේ ලීඩර්* කාර්යාලයටමත් ආන්ඩුවට ගැති බවට සැක කරන මැරයන් විසින් කිහිප වතාවක දී ම පහර දී තිබේ.

2007 වසරේ දී *සන්ඬේ ටයිම්ස්* පත්‍රයේ දිගු කලක සිට ආරක්ෂක ලිපි පලකල ඉක්බාල් අතාස්, යුක්‍රේනයෙන් මිලට ගත් මිග් ප්‍රහාරක යානා පිලිබඳව එම ආරක්ෂක අමාත්‍යාංශයේ ම ගනුදෙනු වලට අදාල ලිපි ගනනාවක් පල කිරීමෙන් පසුව බියගන්වා නිහඬ කරන ලදී. 2007 අගෝස්තු මාසයේ දී ආන්ඩුවට ගැති මැර කන්ඩායමක් ඔහු "ගරිල්ලා ආධාරකරුවෙකු" ලෙස හෙලාදකිමින් ඔහුගේ නිවස අසල උද්ඝෝෂනයක යෙදුනේය. අතාස්ගේ ලිපි පලකිරීම මත *සන්ඬේ ටයිම්ස්* කාර්ය මන්ඩලයට ද තර්ජන එල්ල විය. (බලන්න-"ආරක්ෂක දූෂන මගඩියක් මුල් කර ගෙන ආන්ඩුව මාධ්‍ය වේදියා නිහඬ කරයි" )

මෙම වසරේ ජනවාරියේ දී පුවත්පතේ ප්‍රධාන කර්තෘ ලසන්ත වික්‍රමතුංග කොලඹ ඔහුගේ කාර්යාලයට යමින් සිටියදී මහ දවල් මරා දැමීය. අවට ඇඩි ආරක්ෂක රැකවල් ලා තිබියදීත් යතුරු පැදිවලින් පැමිනි ඝාතකයන්ට ඔහුගේ රිය නතර කොට ඔහු මරා දමා පැන යාමට පුලුවන් විය. අද දක්වා ඝාතනය පිලිබඳව මූලික පරීක්ෂන වාර්තාවක් වත් පොලිසිය විසින් ඉදිරිපත් කොට නැත.

අධිෂ්ඨාන සහගත ලෙස *සන්ඬේ ලීඩර්* ට එරෙහිව රාජපක්ෂ ගෙන යන ව්‍යාපාරය, සියලු වැඩ කරන ජනතාවට කෙරෙන අනතුරු ඇඟවීමකි. වත්මන් ආර්ථික අර්බුදයේ බර කම්කරු පන්තිය මත පැටවීම සඳහා ආන්ඩුව "ආර්ථික යුද්ධය" උත්සන්න කොට ඇති තත්ත්වය හමුවේ එහි ප්‍රතිපත්ති කෙරෙහි මතුවන විරෝධය මැඩීම සඳහා ද එම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවේදය ම යොදා ගැනීමට ආන්ඩුව පසුබට නොවනු ඇත.

© www.wsws.org